**සැ. යු.** - 2018.02.02 වැනි දින පළ වූ අංක 2057 දරන *ගැසට් පත්‍රයේ* IV (අ) කොටස පළ නොවිය

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 2,058 - 2017 පෙබරවාරි මස 09 වැනි සිකුරාදා - 2018.02.09**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස : I වැනි ඡෙදය - සාමාන්‍ය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිටුව |
|---|---|
| ජනාධිපතිතුමාණන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය | — |
| ජනාධිපතිතුමාණන් විසින් කරන ලද පත්කිරීම් ආදිය ... | 144 |
| අමාත්‍ය මණ්ඩලය විසින් කරන ලද පත්කිරීම් ආදිය ... | — |
| රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් කරන ලද පත්කිරීම් ආදිය | — |
| අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් කරන ලද පත්කිරීම් ආදිය | — |
| වෙනත් පත්කිරීම් ආදිය ... ... ... ... | — |
| රෙජිස්ට්‍රාර්වරුන්ගේ පත්කිරීම් ආදිය ... ... ... | — |

| | පිටුව |
|---|---|
| රජයේ නිවේදන ... ... ... | 147 |
| මිල පාලන දැන්වීම් ... ... ... | — |
| ශ්‍රී ලංකා මහ බැංකුවේ දැන්වීම් ... ... ... | — |
| ශ්‍රී ලංකාණ්ඩුවේ ගිණුම් ප්‍රකාශන ... ... ... | — |
| ආදායම් හා වියදම් පිළිබඳ වාර්තා ... ... ... | 148 |
| විවිධ දෙපාර්තමේන්තු දැන්වීම් ... ... ... | 161 |
| නැවියන්ට දැන්වීම් ... ... ... | — |
| සුරාබදු ආඥාපනත පිළිබඳ දැන්වීම් ... ... ... | — |


**සැ. යු.** - කොළඹ ව්‍යාපාර වස්තු විනිමය ස්ථානය අසාමුහිකරණය කිරීමේ පනත් කෙටුම්පත 2018 ජනවාරි මස 26 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළකරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. **නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.**

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2018 මාර්තු මස 02 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2018 පෙබරවාරි මස 16 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගණුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය."*

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති. (වැ. බ.).

2018 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www. documents. gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

143 – B 081250 — 403 (2018/02)

# ජනාධිපතිතුමාණන් විසින් කරන ලද පත්කිරීම් ආදිය

2018 අංක 68

## ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්ථිර බල හමුදාව

අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද නිළ උසස් කිරීම් තනතුරු අත්හැරීම් හා පත්කිරීම්

**උසස් කිරීම**

1. පහත නම් සඳහන් ජ්‍යෙෂ්ඨ නිලධාරින් 2017 දෙසැම්බර් මස 04 දින සිට තාවකාලික මේජර් ජෙනරල් නිලයට උසස් කිරීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත.

(1) බ්‍රිගේඩියර් සී එස් ඇටිපොල යූඑස්පී එල්එස්සී (නි/60443)
(2) බ්‍රිගේඩියර් ඩබ් ඒ වී ඒ සුදසිංහ යූඑස්පී එන්ඩීසී අයිජී (නි/60369)
(3) බ්‍රිගේඩියර් එච් ආර් කේ පී පීරිස් යූඑස්පී (නි/60377)
(4) බ්‍රිගේඩියර් ටී එස් බන්සජයා ආර්ඩබ්පී ආර්එස්පී යූඑස්පී එන්ඩියූ (නි/60378)

**තනතුරු අත්හැරීම් හා පත්කිරීම්**

2. පහත නම් සඳහන් ජ්‍යෙෂ්ඨ නිලධාරින්ගේ තනතුරු අත්හැරීම් හා පත්කිරීම් 2017 දෙසැම්බර් මස 04 දින සිට ක්‍රියාත්මක කිරීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත.

(අ) බ්‍රිගේඩියර් (තාවකාලික මේජර් ජෙනරල්) සී එස් ඇටිපොල යූඑස්පී එල්එස්සී (නි/60443) ආරක්ෂක සේනා මූලස්ථානය (මූලතිව්) හි බ්‍රිගේඩියර් (පාලන හා හටකාර්‍ය සම්පාදක) තනතුර අත්හැරීම හා ඉදිරි නඩත්තු පෙදෙස (උතුර) හි ආඥපති වශයෙන් පත්කිරීම.

(ආ) බ්‍රිගේඩියර් (තාවකාලික මේජර් ජෙනරල්) ඩබ් ඒ වී ඒ සුදසිංහ යූඑස්පී එන්ඩීසී අයිජී (නි/60369) 643 බළසේනාවේ බළසේනාධිපති තනතුර අත්හැරීම හා ප්‍රධාන සංඥ නිළධාරි වශයෙන් පත්කිරීම.

(ඇ) බ්‍රිගේඩියර් (තාවකාලික මේජර් ජෙනරල්) එච් ආර් කේ පී පීරිස් යූඑස්පී (නි/60377) 533 බළසේනාවේ බළසේනාධිපති තනතුර අත්හැරීම හා 24 සේනාංකයේ සේනාංකාධිපති වශයෙන් පත්කිරීම.

(ඈ) බ්‍රිගේඩියර් (තාවකාලික මේජර් ජෙනරල්) ටී එස් බන්සජයා ආර්ඩබ්පී ආර්එස්පී යූඑස්පී එන්ඩියූ (නි/60378) 58 සේනාංකයේ නියෝජ්‍ය සේනාංකාධිපති තනතුර අත්හැරීම හා ඉදිරි නඩත්තු පෙදෙස (උතුරු මැද) හි ආඥපති වශයෙන් පත්කිරීම.

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

කපිල වෛද්‍යරත්න, ජනාධිපති නීතිඥ,
ලේකම්,
ආරක්ෂක අමාත්‍යාංශය.

2018 ජනවාරි මස 20 වැනි දින,
කොළඹ දී ය.

02 - 290

2018 අංක 69

MOD/DEF/02/01/RET/1571.

## ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්ථිර බල හමුදාව

අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද නිල ස්ථිර කිරීමක් සහ විශ්‍රාම ගැනීමක්

**නිළ ස්ථිර කිරීමක්**

පහත නම සඳහන් ජ්‍යෙෂ්ඨ නිලධාරි 2018 ජනවාරි මස 29 වැනි දින සිට ලුතිනන් කර්නල් නිලයේ ස්ථිර කිරීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත.

තාවකාලික ලුතිනන් කර්නල් සුජීව සමරවීර විජේතිලක, ශ්‍රීලයුපොහේබ (නි/61769)

**විශ්‍රාම ගැනීමක්**

පහත නම සඳහන් ජ්‍යෙෂ්ඨ නිලධාරි 2018 ජනවාරි මස 29 වැනි දින සිට ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ ස්ථිර බල හමුදාවෙන් විශ්‍රාම ගැනීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත.

ලුතිනන් කර්නල් සුජීව සමරවීර විජේතිලක, ශ්‍රීලයුපොහේබ (නි/61769)

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

කපිල වෛද්‍යරත්න, ජනාධිපති නීතිඥ,
ලේකම්,
ආරක්ෂක අමාත්‍යාංශය.

2018 ජනවාරි මස 11 වැනි දින,
කොළඹ දී ය.

02 - 291

---

2018 අංක 70

MOD/DEF/03/02/8/7.

## ශ්‍රී ලංකා නාවික හමුදාව - ස්ථිර නාවික බලකාය

අතිගරු ජනාධිපතිතුමන් විසින් අනුමත කරන ලද නිලයේ ස්ථිර කිරීම්

*2017 පෙබරවාරි මස 26 වැනි දින සිට ලුතිනන් කොමාණ්ඩර් වශයෙන් :*

ලුතිනන් [තාවකාලික ලුතිනන් කොමාණ්ඩර්] කොස්වින්නගේ ජනක ප්‍රසාද් රෝහණ, එන්ආර්එක්ස් 2344, ශ්‍රීලංනාහ

*2017 මාර්තු මස 19 වැනි දින සිට ලුතිනන් කොමාණ්ඩර් (ඉ) වශයෙන් :*

ලුතිනන් (ඉ) [තාවකාලික ලුතිනන් කොමාණ්ඩර් (ඉ)] ජුනයිදීන් මොහොමඩ් දුෂාක්, එන්ආර්ඊ 2335, ශ්‍රීලංනාහ

*2017 මාර්තු මස 26 වැනි දින සිට ලුතිනන් කොමාණ්ඩර් වශයෙන් :*

ලුතිනන් [තාවකාලික ලුතිනන් කොමාණ්ඩර්] ඉරාන් චතුරංග වික්‍රමරත්න, එන්ආර්එක්ස් 2339, ශ්‍රීලංනාහ

ලුතිනන් [තාවකාලික ලුතිනන් කොමාණ්ඩර්] සකලසූරිය මුදියන්සේලාගේ මන්ජුල ලසන්ත බණ්ඩාර සකලසූරිය එන්ආර්එක්ස් 2342, ශ්‍රීලංනාහ

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

කපිල වෛද්‍යරත්න, ජනාධිපති නීතිඥ,
ලේකම්,
ආරක්ෂක අමාත්‍යාංශය.

2018 ජනවාරි මස 11 වැනි දින,
කොළඹ දී ය.

02 - 371

---

2018 අංක 71

MOD/DEF/03/02/8/7.

**ශ්‍රී ලංකා නාවික හමුදාව - ස්ථිර නාවික බලකාය**

අතිගරු ජනාධිපතිතුමන් විසින් අනුමත කරන ලද උසස් කිරීම්

*2017 අප්‍රේල් මස 08 වැනි දින සිට තාවකාලික ලුතිනන් කොමාණ්ඩර් (ඉ) වශයෙන් :*

ලුතිනන් (ඉ) වලිසුන්දර මුදියන්සේලාගේ මොහාන් ලාල් පේශල බණ්ඩාර වලිසුන්දර, එන්ආර්ඊ 2416, ශ්‍රීලංනාහ

*2017 අගෝස්තු මස 21 වැනි දින සිට තාවකාලික ලුතිනන් කොමාණ්ඩර් (සැ) වශයෙන් :*

ලුතිනන් (සැ), පෙත්තාවඩු ලකීෂා නිසංසලා ද සිල්වා, එන්ආර්එස් 2690, ශ්‍රීලංනාහ

*2017 ඔක්තෝබර් මස 31 වැනි දින සිට තාවකාලික ලුතිනන් කොමාණ්ඩර් වශයෙන් :*

ලුතිනන්, පසන් භාග්‍ය යටමලගල පතිරණ, එන්ආර්එක්ස් 2485, ශ්‍රීලංනාහ

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

කපිල වෛද්‍යරත්න, ජනාධිපති නීතිඥ,
ලේකම්,
ආරක්ෂක අමාත්‍යාංශය.

2017 දෙසැම්බර් මස 22 වැනි දින,
කොළඹ දී ය.

02 - 372

2018 අංක 72

MOD/DEF/03/02/8/7.

**ශ්‍රී ලංකා නාවික හමුදාව - ස්ථිර නාවික බලකාය**

අතිගරු ජනාධිපතිතුමන් විසින් අනුමත කරන ලද උසස් කිරීම්

*2017 නොවැම්බර් මස 14 වැනි දින සිට තාවකාලික ලුතිනන් කොමාණ්ඩර් (සැ) වශයෙන් :*

ලුතිනන් (සැ), ජනක දුෂ්මන්ත බණ්ඩාර ගලගොඩ, එන්ආර්එස් 2508, ශ්‍රීලංනාහ

*2017 නොවැම්බර් මස 17 වැනි දින සිට තාවකාලික ලුතිනන් කොමාණ්ඩර් (තොතා) වශයෙන් :*

ලුතිනන් (තොතා), වනසූරිය මුදියන්සේලාගේ චින්තක කසුන් වනසූරිය, එන්ආර්ටී 3146, ශ්‍රීලංනාහ

ලුතිනන් (තොතා), ධනුක සමාධි දිසානායක, එන්ආර්ටී 3148. ශ්‍රීලංනාහ

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

කපිල වෛද්‍යරත්න, ජනාධිපති නීතිඥ,
ලේකම්,
ආරක්ෂක අමාත්‍යාංශය.

2018 ජනවාරි මස 11 වැනි දින,
කොළඹ දී ය.

02 - 369

---

2018 අංක 73

MOD/DEF/03/02/COM 1.

**ශ්‍රී ලංකා නාවික හමුදාව - ස්වේච්ඡා නාවික බලකාය**

අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කරන ලද අධිකාරියෙන් ඉල්ලා අස්වීම

2017 නොවැම්බර් මස 25 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි ශ්‍රී ලංකා නාවික හමුදා ස්වේච්ඡා බලකායේ පහත නම් සඳහන්

නිලධාරීන් අධිකාරියෙන් ඉල්ලා අස්වීම අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කර ඇත.

ලුතිනන් (ස්වේ), ගයාන් කාංචන මනම්පේරි, එන්වීඑක්ස් 5722
ලුතිනන් (ස්වේ), රණතුංග ගමරාළලාගේ පුබුදු රණතුංග, එන්වීඑක්ස් 5724

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

කපිල වෛද්‍යරත්න, ජනාධිපති නීතිඥ,
ලේකම්,
ආරක්ෂක අමාත්‍යාංශය.

2017 දෙසැම්බර් මස 05 වැනි දින,
කොළඹ දී ය.

02 - 370

---

2018 අංක 74

MOD/DEF/03/02/EX.

**ශ්‍රී ලංකා නාවික හමුදාව - ස්වේච්ඡා නාවික බලකාය**

අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කරන ලද
ස්වේච්ඡා නාවික උපසේවයට මාරු කිරීමක්

2018 ජනවාරි මස 07 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි පහත නම සඳහන් නිලධාරියා ශ්‍රී ලංකා නාවික හමුදා ස්වේච්ඡා නාවික බලකායේ සිට ස්වේච්ඡා නාවික උපසේවයට මාරු කිරීම අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කර ඇත.

ලුතිනන් (ස්වේ), සකලසූරිය මුදියාන්සේලාගේ රණසිංහ බංඩාර, එන්වීඑක්ස් 5514

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

කපිල වෛද්‍යරත්න, ජනාධිපති නීතිඥ,
ලේකම්,
ආරක්ෂක අමාත්‍යාංශය.

2018 ජනවාරි මස 11 වැනි දින,
කොළඹ දී ය.

02 - 374

---

2018 අංක 75

MOD/DEF/03/02/EX.

**ශ්‍රී ලංකා නාවික හමුදාව - ස්වේච්ඡා නාවික බලකාය**

අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කරන ලද
ස්වේච්ඡා නාවික උපසේවයට මාරු කිරීමක්

2018 ජනවාරි මස 29 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි පහත නම සඳහන් නිලධාරියා ශ්‍රී ලංකා නාවික හමුදා ස්වේච්ඡා නාවික බලකායේ සිට ස්වේච්ඡා නාවික උපසේවයට මාරු කිරීම අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කර ඇත.

ලුතිනන් (ස්වේ), රත්මලානගේ අතුල නිරංජන් ප්‍රනාන්දු, එන්වීඑක්ස් 5505

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

කපිල වෛද්‍යරත්න, ජනාධිපති නීතිඥ,
ලේකම්,
ආරක්ෂක අමාත්‍යාංශය.

2017 දෙසැම්බර් මස 08 වැනි දින,
කොළඹ දී ය.

02 - 373

# රජයේ නිවේදන

මගේ අංකය : ආර්ජී/එන්බී/11/2/105/2017/පිටු/සැ.

## රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

### ඉඩම් ලියාපදිංචි කිරීමේ පොත්වල නැවත සකස් කළ පිටු පිළිබඳ (120 අධිකාරය) ආඥාපනත

01. මෙහි පහත උපලේඛනයෙහි දෙවැනි තීරුවේ සඳහන් ඉඩම් සහ තුන්වැනි තීරුවෙහි සඳහන් ඔප්පුවලට අදාළ පළමුවන තීරුවේ දැක්වෙන දැනට කැඩී බිඳී ගොස් ඇති ඉඩම් ලියාපදිංචි කළ පොත්/පිටුව නැවත සම්පූර්ණව, තාවකාලිකව සකස් කර ඇති බැව් ඉඩම් ලියාපදිංචි කළ පොත්වල නැවත සකස් කළ පිටු පිළිබඳ (120 අධිකාරය) ආඥාපනතේ 4 වැනි වගන්තිය අනුව මෙයින් දැනුම් දෙමි.

02. වර්ෂ 2018.02.09 වැනි දින සිට 2018.02.23 වැනි දින දක්වා සතියේ වැඩ කරන දිනවල පෙ.ව. 10.00 සිට ප. ව. 3.00 දක්වා ඕනෑම අයෙකුට ඉහත කී තාවකාලික පිටුව මීගමුව ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ දී පරීක්ෂාකර බැලිය හැකි ය.

03. එම තාවකාලික පිටුවේ කිසියම් හෝ එවැනි සටහනක අඩංගු යම් කරුණක් පිළිබඳව යම් විරුද්ධත්වයක් ප්‍රකාශ කර සිටීමට කැමති කෙනෙකු විසින් හෝ යම් සටහනක් හෝ යම්කිසි සටහනකින් අතහැර දමන ලද කරුණක් අඩංගු කරවා ගැනීමට ඉල්ලීමක් ඉදිරිපත් කිරීමට කැමති කෙනෙකු විසින් එකී විරුද්ධත්වය හෝ ඉල්ලීම අඩංගු ලියවිල්ලක් සවිස්තරාත්මකව පැහැදිලිව එය තහවුරු කෙරෙන ලියවිලි සමග 2018.03.02 වැනි දිනට පෙර මෙහි පහත අත්සන් කළ අයට ලැබෙන සේ රෙජිස්ට්‍රාර් ජනරාල් කාර්යාලය වෙත ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය.

රංජිත් දයානන්ද,
රෙජිස්ට්‍රාර් ජනරාල් වෙනුවට,
ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය රෙජිස්ට්‍රාර් ජනරාල්.

රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව,
අංක 234/ඒ3,
ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
බත්තරමුල්ල.

**උපලේඛනය**

| *ලියාපදිංචි පොත්වල කැඩී බිඳී ඇති පිටුවල විස්තර* | *ඉඩම්වල විස්තර* | *ලියාපදිංචි කළ ඔප්පුවල විස්තර* |
|---|---|---|
| ගම්පහ දිස්ත්‍රික්කයේ, මීගමුව ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ සී කොට්ඨාසයේ 734 වෙළුමේ 105 පත්‍රිරුව. | බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, ලියනගේමුල්ල ගමේ දසිය පත්තුවේ,, අලුත්කුරු කෝරළේ පිහිටි උප්පලාන හෙවත් කඩොල් කැලේ දැනට සෝමාස් ලෑන්ඩ් නැමැති ඉඩමේ ලොට් සී සඳහා මායිම්,<br><br>උතුරට : පාර සහ ලොට් බී,<br>නැගෙනහිරට : කේ. එස්. ද එස්. ප්‍රේමතිරත්න හා වෛද්‍ය කේ. එස්. ප්‍රේමතිරත්නට අයත් ඉඩම<br>දකුණට. : දිය බස්නා ඇල,<br>බටහිරට : ලොට් බී.<br><br>ප්‍රමාණය : අ. 0, රූ. 3, පර්. 10 (හෙ. 0.32881) | 01. මාලිනී සහාරත්නම් ප්‍රසිද්ධ නොතාරිස් විසින් ලියා සහතික කරන 1992.04.27 වැනි දින අංක 6709 දරන විකුණුම්කරය. |

02 - 244

# ආදයම් හා වියදම් පිළිබඳ වාර්තා

## කොළඹ විශ්වවිද්‍යාලය

මූල්‍ය තත්ත්ව වාර්තාව

**2016 දෙසැම්බර් මස 31 වැනි දින වන විට**
**(අගය ආසන්නතම රුපියලට වටයා ඇත)**

| | සටහන් | 2016 රු. ශත | | 2015 රු. ශත | |
|---|---|---|---|---|---|
| **වත්කම්** | | | | | |
| **ජංගම වත්කම්** | | | | | |
| මුදල් සහ මුදල් වලට සමාන දෑ | 1 | 291,720,682 | | 316,420,640 | |
| සැපයුම් සහ සේවා සඳහා අත්තිකාරම් | 2 | 119,266,200 | | 62,898,214 | |
| විවිධ අත්තිකාරම් | 3 | 8,399,336 | | 12,464,001 | |
| ඉදිරියට කළ ගෙවීම් | | 3,775,845 | | 6,212,383 | |
| බඩු වට්ටෝරු සහ තොග | | 23,867,395 | | 22,465,478 | |
| විවිධ ණයගැතියෝ | 4 | 427,809,776 | **874,839,233** | 462,992,890 | **883,453,606** |
| **ජංගම නොවන වත්කම්** | | | | | |
| සේවක ණය සහ අත්තිකාරම් | 5 | 132,846,851 | | 135,247,757 | |
| සැපයුම් සහ සේවා සහ අත්තිකාරම් | 2 | 21,907,108 | | 70,427,288 | |
| විවිධ අත්තිකාරම් | 3 | 1,366,962 | | 387,349 | |
| විවිධ ණයගැතියෝ | 4 | 16,297,432 | | 14,938,792 | |
| ආයෝජන | 6 | 2,506,759,479 | | 2,143,524,720 | |
| දේපළ, පිරියත සහ උපකරණ | 7 | 40,857,989,665 | | 40,421,366,123 | |
| කෙරීගෙන යන වැඩ | 8 | 1,263,868,022 | **44,801,035,520** | 1,050,778,104 | **43,836,670,132** |
| **මුළු වත්කම්** | | | **45,675,874,753** | | **44,720,123,738** |
| **වගකීම්** | | | | | |
| **ජංගම වගකීම්** | | | | | |
| ගෙවිය යුතු ගිණුම් | 9 | 150,575,917 | | 143,202,673 | |
| උපචිත වියදම් | | 148,667,033 | | 118,516,650 | |
| ආපසු ගෙවිය යුතු තැන්පතු | 10 | 9,051,437 | **308,294,387** | 20,978,449 | **282,697,772** |
| **ජංගම නොවන වගකීම්** | | | | | |
| විලම්බිත ආදයම් බාහිර පාඨමාලා | | 827,894,984 | | 643,763,183 | |
| විලම්බිත ආදයම් පර්යේෂණ ප්‍රදාන සහ කේන්ද්‍ර | | 138,906,982 | | 105,248,923 | |
| පාර්තෝෂික වෙන් කිරීම් | | 504,982,012 | | 431,406,440 | |
| ගෙවිය යුතු ගිණුම් | 9 | 92,056,587 | | 12,907,532 | |
| ආපසු ගෙවිය යුතු තැන්පතු | 10 | 27,512,001 | **1,591,352,567** | 25,370,809 | **1,218,696,887** |
| **මුළු වගකීම්** | | | **1,899,646,953** | | **1,501,394,660** |
| **ශුද්ධ වත්කම්** | | | **43,776,227,800** | | **43,218,729,079** |

| සටහන් | 2016 | 2015 | | | |
|---|---|---|---|---|---|
| | | රු. ශත | | රු. ශත | |
| **හිමිකම්/ශුද්ධ වත්කම්** | | | | | |
| **ප්‍රාග්ධන** | | | | | |
| වැය වූ ප්‍රාග්ධන ප්‍රදාන | | 3,743,961,701 | | 3,009,646,941 | |
| වැය නොවූ ප්‍රාග්ධන ප්‍රදාන | | 155,616,537 | | 128,889,218 | |
| ත්‍යාග සහ පරිත්‍යාග | 11 | 353,425,750 | **4,253,003,987** | 259,529,214 | **3,398,065,373** |
| **සමුච්චිත අරමුදල** | | | | | |
| පොදු සංචිත | | 19,004,980 | | 19,004,980 | |
| ආදායම් සහ වියදම් ගිණුම | | (804,906,610) | | (343,213,845) | |
| වත්කම් නැවත තක්සේරු කිරීමේ සංචිතය | | 38,668,804,204 | **37,882,902,573** | 38,756,102,103 | **38,431,893,238** |
| **සංචිත සහ නිශ්චිත අරමුදල්** | | | | | |
| විශේෂ සංචිත | 12 | 1,533,687,169 | | 1,285,590,461 | |
| ත්‍යාග සහ පරිත්‍යාග | | 105,003,666 | | 97,364,698 | |
| වෙනත් අරමුදල් | 13 | 1,630,404 | **1,640,321,239** | 5,815,310 | **1,388,770,469** |
| **මුළු හිමිකම්/ශුද්ධ වත්කම්** | | | **43,776,227,800** | | **43,218,729,079** |

සකස් කිරීම (විසින්)

.........................................................
ආර්. එම්. එම. එච්. ඩී. රාජපක්ෂ,
ජ්‍යෙෂ්ඨ සහකාර මූල්‍යාධිකාරි.

සහතික කළේ

.........................................................
කේ. එස්. ටී. ස්වර්ණලතා ජයසූරිය,
මූල්‍යාධිකාරී.

මෙම මූල්‍යමය ප්‍රකාශ පාලක සභා මණ්ඩලය විසින් අනුමත කරන ලද අතර ඔවුන් ඒ වෙනුවෙන් අත්සන් තබන ලදී.

.........................................................,
රාජන් ආශිර්වාදන්,
පාලක සභා සාමාජික.

.........................................................
මහාචාර්ය ලක්ෂ්මන් දිසානායක,
උපකුලපතිතුමා.

**කොළඹ විශ්වවිද්‍යාලය**

මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනය

**2016 දෙසැම්බර් මස 31 වැනි දයින් අවසන් වූ**
**(ගණන් ආසන්න රුපියලට වටයා ඇත)**

| සටහන | | | | | | 2016 රු. ශත | 2015 රු. ශත |
|---|---|---|---|---|---|---|---|
| ආදායම | භාණ්ඩාගාරය රු. ශත | ව්‍යාප්ති පාඨමාලා | පර්යේෂණ ප්‍රදාන | මධ්‍යස්ථාන | අරමුදල් | එකතුව | |
| (A) පුනරාවර්තන වියදම් සඳහා රජයේ ප්‍රදන | 2,397,000,000 | - | - | | - | 2,397,000,000 | 2,238,000,000 |
| (B) ප්‍රතිසංස්කරණ සහ ප්‍රධාන වත්කම් නඩත්තුව වෙනුවෙන් රජයේ ප්‍රදන | 70,803,833 | - | - | | - | 70,803,833 | 55,110,699 |

| සටහන | | | 2016 රු. ශත | | | | 2015 රු. ශත | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදයම | භාණ්ඩාගාරය | ව්‍යාප්ති පාඨමාලා | පර්යේෂණ ප්‍රදාන | මධ්‍යස්ථාන | අරමුදල් | එකතුව | | |
| (C) ක්‍රමක්ෂ ප්‍රාග්ධන ප්‍රදාන | 396,510,252 | - | - | | - | 396,510,252 | 355,972,158 | |
| (D) ශිෂ්‍යාධාර සඳහා ප්‍රදාන | 45,885,300 | - | - | | - | 45,885,300 | 24,317,900 | |
| (E) මහපොළ සඳහා ප්‍රදාන | | | | | | | | |
| (i) වි.ප්‍ර.කො | 149,202,550 | - | - | | - | 149,202,550 | 83,621,800 | |
| (ii) මහපොළ භාරකාර අරමුදල් | 145,205,250 | - | - | | - | 145,205,550 | 109,911,500 | |
| (F) ශ්‍රී ලංකාවේ විශ්ව විද්‍යාල ජාත්‍යන්තරී කරණය | 27,559,681 | - | - | | - | 27,559,681 | 26,350,516 | |
| (G) දැනුම දියුණු කිරීම සහ ආයතනික සංවර්ධනය | 921,900 | - | - | | - | 921,900 | 3,843,164 | |
| (H) පර්යේෂණ | 4,046,632 | - | - | | - | 4,046,632 | 2,053,559 | |
| (I) විදේශ ශිෂ්‍ය ශිෂ්‍යත්ව | 7,204,000 | - | - | | - | 7,204,000 | - | |
| (J) වි.ප්‍ර.කො. ප්‍රදාන හිඟ, සේ.භා.අ. වි.භා.අ. | 1,320,919 | - | - | | - | 1,320,919 | 6,444,829 | |
| (K) කා.ම.ස. ආ. සඳහා වි.කො.ස. ප්‍රදාන | - | - | - | | - | - | 2.000,000 | |
| | **3,245,660,317** | - | - | | - | **3,245,660,317** | | **2,907,626,125** |
| | උපයන ආදයම | බාහිර පාඨමාලා | පර්යේෂණ ප්‍රදාන | මධ්‍යස්ථාන | අරමුදල් | එකතුව | | |
| ලියාපදිංචි ගාස්තු - ප්‍රථම උපාධි | 8,729,420 | - | - | | - | 8,729,420 | 5,963,910 | |
| ලියාපදිංචි ගාස්තු - පශ්චාත් උපාධි | 734,559 | - | - | | - | 734,559 | 1,339,000 | |
| විභාග ගාස්තු - ප්‍රථම උපාධි | 763,340 | - | - | | - | 763,340 | 82,950 | |
| විභාග ගාස්තු - පශ්චාත් උපාධි | 724,100 | - | - | | - | 724,100 | 405,500 | |
| පාඨමාලා ගාස්තු - ප්‍රථම උපාධි | 38,601,818 | - | - | | - | 38,601,818 | 12,722,606 | |
| පාඨමාලා ගාස්තු - පශ්චාත් උපාධි | 4,087,750 | - | - | | - | 4,087,750 | 5,916,500 | |
| ණය සහ අත්තිකාරම් පොළී | 5,370,626 | - | - | | - | 5,370,626 | 5,367,093 | |
| ආයෝජන පොළී | 188,164,332 | - | - | | - | 188,164,332 | 130,318,795 | |
| ප්‍රකාශන අලෙවිය | - | - | - | | - | - | 18,000 | |
| පරණ තොග විකිණුම්/ අබලි ද්‍රව්‍ය විකුණුම් | 2,027 | - | - | | - | 2,027 | 3,676 | |
| ආයෝජන ආදයම් | - | - | - | | - | - | - | |
| සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීමේ ගාස්තු | 1,105,000 | - | - | | - | 1,105,000 | 1,058,500 | |
| දේපළවලින් ලද කුළී | 2,456,276 | - | - | | - | 2,456,276 | 6,099,869 | |
| වෛද්‍ය ගාස්තු | 16,800 | - | - | | - | 16,800 | 910,700 | |
| පුස්තකාල දඩ | 1,043,268 | - | - | | - | 1,043,268 | 1,711,887 | |
| විවිධ ක්‍රියාකාරකම් | 4,165,350 | - | - | | - | 4,165,350 | 3,307,455 | |
| විවිධ ලැබීම් | 49,786,400 | - | - | | - | 49,786,400 | 35,403,131 | |
| වත්කම් නැවත අගය කිරීම්වලින් ලද පාඩුව | - | - | - | | - | - | 4,855,995 | |
| ස්ථාවර වත්කම් විකිණීමේ අලාභ | 4,303,038 | - | - | | - | 4,303,038 | 2,802,449 | **1,335,314,698** |
| | **981,327,424** | - | - | | - | **981,327,424** | | |
| මුළු වියදම | **3,624,883,009** | **255,994,883** | **75,458,813** | **15,398,464** | **186,299,318** | **4,158,034,487** | | |
| වියදමට වඩා ආදයමේ අතිරික්තය | **(49,773,721)** | **225,930,813** | - | | - | **176,157,091** | | **326,038,151** |

**කොළඹ විශ්වවිද්‍යාලය**

2016.12.31න් අවසන් වූ වසර සඳහා

මුදල් ප්‍රවාහ ප්‍රකාශය

| | *2016* | | *2015* | |
|---|---|---|---|---|
| | *රු. ශත* | *රු. ශත* | *රු. ශත* | *රු. ශත* |
| මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත/(වැයවූ) මුල්‍ය ප්‍රවාහ | | | | |
| සාමාන්‍ය ක්‍රියාකාරකම්වලින් ලද අතිරික්ත | | 176,157,091 | | 326,038,151 |
| මුදල් නොවන සංචලන | | | | |
| ක්ෂය | 462,060,394 | | 412,544,588 | |
| ස්ථාවර වත්කම්වල ක්‍රමක්ෂය | (396,510,252) | | (355,972,158) | |
| පාරිතෝෂිත දීමනා වෙන්කිරීම | 103,644,270 | | 38,411,238 | |
| පොළී ආදායම | (193,534,958) | | (135,685,888) | |
| විදේශ විනිමය හුවමාරු ලැබීම් | (610,322) | | (1,235,279) | |
| කල්බදු පොළී ගෙවීම් | 3,011,526 | | | |
| වත්කම් නැවත අගය කිරීම්වලින් ලද පාඩුව | - | | 4,855,995 | |
| වත්කම් බැහැර කිරීම්වලින් ලද ලාභය | 4,303,038 | (17,636,305) | 2,802,449 | (34,279,055) |
| කාරක ප්‍රාග්ධන වෙන්ස්වීම්වලට පෙර ක්‍රියාත්මක අතිරික්තය | | 158,520,787 | | 291,759,096 |
| කාරක ප්‍රාග්ධන වෙනස්වීම් | | | | |
| ගබඩා සහ භාණ්ඩ තොගවල වැඩිවීම | (1,401,917) | | (7,584,503) | |
| වෙනත් ලැබිය යුතු ලැබීම්වල අඩුවීම | 33,824,475 | | (131,935,717) | |
| පෙර ගෙවුම්වල අඩුවීම | 2,436,538 | | | |
| අත්තිකාරම්වල වැඩිවීම | (2,361,848) | | | |
| උපචිත ගිණුම් හි වැඩිවීම | 30,150,383 | | | |
| ගෙවිය යුතු තැන්පතු අඩුවීම | (9,785,821) | | | |
| ගෙවිය යුතු ගිණුම්හි වැඩිවීම | 86,522,299 | 139,384,111 | 222,184,289 | 82,664,069 |
| මෙහෙයුම් ක්‍රියාකාරකම්වල භාවිත මුදල් ප්‍රවාහ | | 297,904,897 | | 374,423,165 |
| පාරිතෝෂික ගෙවීම් | (30,068,698) | (30,068,898) | (21,424,242) | (21,424,242) |
| මෙහෙයුම් ක්‍රියාකාරකම්වල භාවිත ශුද්ධ මුදල් ප්‍රවාහ | | 267,836,200 | | 352,998,923 |
| ආයෝජන ක්‍රියාකාරකම් වෙතින්/(භාවිත) මුදල් ප්‍රවාහ | | | | |
| ස්ථාවර වත්කම් අත්පත් කර ගැනීම් | (805,390,685) | | (240,344,126) | |
| කෙරෙමින් පවතින වැඩ | (213,089,918) | | (516,415,940) | |
| ආයෝජන වැඩිවීම් | (363,234,760) | | (406,738,878) | |
| ස්ථාවර වත්කම් බැහැර කිරීමෙන් ශේෂය | 1,854,692 | | 733,720 | |
| ආයෝජන වෙතින් පොළී | 67,047,075 | (1,312,813,596) | 39,874,533 | (1,122,890,691) |
| ආයෝජන ක්‍රියාකාරකම් වෙතින්/(භාවිත) මුදල් ප්‍රවාහ | | (1,044,977,397) | | (769,891,768) |
| මුල්‍ය ක්‍රියාකාරකම් වෙතින්/(භාවිත) මුදල් ප්‍රවාහ | | | | |
| ප්‍රාග්ධන වියදම් සඳහා රජයේ ප්‍රදානය | 632,000,000 | | 615,000,000 | |
| අභ්‍යන්තර අරමුදලේ ශුද්ධ ලැබීම් | 404,987,592 | | 131,718,530 | |
| කල්බදු ගෙවීම් | (16,710,153) | 1,020,277,439 | - | 746,718,530 |
| මුදල් සහ මුදල්වලට සමාන දෑ හි වැඩිවීම | | **(24,699,958)** | | **(23,173,238)** |

| | 2016 | | 2015 | |
|---|---|---|---|---|
| | *රු. ශත* | *රු. ශත* | *රු. ශත* | *රු. ශත* |
| කාල පරිච්ඡේදය ආරම්භයේ දී මුදල් සහ මුදල්වලට සමාන දේ | | 316,420,40 | | 134,818,816 |
| කාල පරිච්ඡේදය අවසානයේ දී මුදල් සහ මුදල්වලට සමාන දේ | | 291,720,682 | | 111,645,578 |
| මුදල් සහ මුදල්වලට සමාන දෙයෙහි ශුද්ධ වැඩිවීම | | **(24,699,958)** | | **(23,173,238)** |

**කොළඹ විශ්වවිද්‍යාලය**

**2016.12.31න් අවසන් වූ වර්ෂය සඳහා කොටස්/ශුද්ධ වත්කම් වෙනස්වීම් ප්‍රකාශය**

| *විස්තරය* | *වැයකළ ප්‍රාග්ධන අරමුදල් රු. ශත* | *වැයනොකළ ප්‍රාග්ධන අරමුදල් රු. ශත* | *සංචිත සහ සීමිත අරමුදල් රු. ශත* | *ත්‍යාග සහ ආධාර රු. ශත* | *වත්කම් ප්‍රතිතක්සේරු සංචිත රු. ශත* | *ආදායම් සහ වියදම් රු. ශත* | *එකතුව රු. ශත* |
|---|---|---|---|---|---|---|---|
| 2016 ජනවාරි 01 වැනි දිනට ශේෂය | 3,009,646,941 | 128,889,218 | 1,388,770,469 | 259,529,214 | 38,756,102,103 | 324,208,865 | 43,218,729,079 |
| වර්ෂය තුළ වැයකළ සහ වැය නොවූ ප්‍රාග්ධන ප්‍රදන | 734,314,760 | 26,727,319 | | | | | 761,042,078 |
| පරිත්‍යාග ක්‍රමක්ෂය | | | | 93,896,536 | | | 93,896,536 |
| වත්කම් නැවත අගය කිරීම් සංචිතය | | | | | (87,297,899) | | (87,297,899) |
| කාල පරිච්ඡේදය සඳහා අතිරික්තය/(හිඟය) | | | | | | 176,157,091 | 176.157,091 |
| අරමුදල් මාරුකර යැවීම් | | | | | | (516,350,402) | (516,350,402) |
| අරමුදල්වල ශුද්ධ සංචලනය | | | 130,051.,316 | | | | 130,051,316 |
| ලෝගු කුලියට ගැනීමේ ගාස්තු ගිණුමට මාරුකිරීම | | | 2,109,600 | | | (2,109,600) | - |
| පොළී ආදයමට මාරු කිරීම - VC අරමුදල | | | 4,721,775 | | | (4,721,775)) | - |
| පොළී ආදයමට මාරු කිරීම - UCDF අරමුදල | | | 50,689,358 | | | (50,689,358) | - |
| පොළී ආදයමට මාරු කිරීම - සීමිත අරමුදල | | | 63,978,721 | | | (63,978,721) | - |
| 2016 දෙසැම්බර් 31 වන විට ශේෂය | 3,743,961,701 | 155,616,537 | 1,640,321,239 | 353,425,750 | 38,668,804,204 | (785,901,630) | 43,776,227,800 |

**කොළඹ විශ්වවිද්‍යාලයේ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 108 (1) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව**

කොළඹ විශ්වවිද්‍යාලයේ 2016 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්තව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශය 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 107(5) උපවගන්තිය සමග සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. විශ්වවිද්‍යාල පනතේ 108(1) උපවගන්තිය ප්‍රකාරව විශ්වවිද්‍යාලයේ වාර්ෂික වාර්තාව සමග ප්‍රකාශයට පත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම :

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

1.3 **විගණකගේ වගකීම :**

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදළවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රාකශයන්ගේ අවදනම් තක්සේරු කිරීම් ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදනම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණනක සැලකිල්ලට ගන්නා නමුත් විශ්වවිද්‍යාලයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 111 වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.4 **තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම :**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

2 **මූල්‍ය ප්‍රකාශන :**

2.1 **තත්ත්වාගණනය කළ මතය :**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශනවලින් 2016 දෙසැම්බර් 31 දිනට කොළඹ විශ්වවිද්‍යාලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.

2.2 **මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දක්වීම :**

2.2.1 **ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන :**

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතට පටහැනිව හා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ හා උසස් අධ්‍යාපන අමාත්‍යවරයාගේ නිර්දේශ සහිතව අමාත්‍ය මණ්ඩල අනුමැතියකින් තොරව කළම්බු සයන්ස් ඇන්ඩ් ටෙක්නොලොජි සෙල් නමින් ඇපයෙන් සීමිත සමාගමක් 2013 වර්ෂයේ දී 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ ලියාපදිංචි කර තිබුණි.

කොළඹ විශ්වවිද්‍යාලයේ විද්‍යාපීඨයේ පීඨාධිපති ඇතුළු කථිකාචාර්යවරුන් 09 දෙනෙකු මෙම සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකත්වය දරන බැවින් විශ්වවිද්‍යාලයේ පූර්ණ පාලන බලය සහිතව පවතින පරිපාලිත සමාගමක් බව පැහැදිලි වේ. ඒ අනුව කොළඹ විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රකාශන සමග සීමිත කලම්බු සයන්ස් ඇන්ඩ් ටෙක්නොලොජි සෙල් සමාගමේ මූල්‍ය ප්‍රකාශන ඒකාබද්ධ කර විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවද, 2016 දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ඒකාබද්ධ ගිණුම් ප්‍රකාශන ඉදිරිපත් කර නොතිබුණි.

මෙම සමාගමේ ප්‍රධාන කාර්යාලය කොළඹ විශ්වවිද්‍යාලයේ විද්‍යා පීඨයට අයත් ගොඩනැගිල්ලක පිහිටුවා විශ්වවිද්‍යාලය සතුව පවතින පරිගණක උපාංග ඇතුලු අනෙකුත් භෞතික හා මානව සම්පත් භාවිතා කර ඇති නමුත් විශ්වවිද්‍යාලය සතු දේපළ භාවිතය පිළිබඳ එකගතා ගිවිසුමකට ඇතුළත් වී නොතිබුණි. සමාලෝචිත වර්ෂය තුළ විශ්වවිද්‍යාලයේ සම්පත් භාවිතය වෙනුවෙන් රු. 191,839 ක මුදලක් පමණක් විශ්වවිද්‍යාලය වෙත ගෙවා තිබුණි.

2.2.2 **විගණනය සඳහා සාක්ෂි නොවීම :**

මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය තුළ වූ රු. 35,296,230,000 ක් වටිනා ඉඩම්වල නීත්‍යානුකූල හිමිකම තහවුරු කිරීම සඳහා හිමිකම් ඔප්පු සමාලෝචිත වර්ෂය අවසානය වනවිටත් ලබාගෙන නොතිබූ අතර පවරා ගැනීමේ කටයුතු සිදුකෙරෙමින් පවතින බව උපකුලපතිවරයා විසින් 2017 අගෝස්තු 17 දින මා වෙත වාර්තා කර තිබුණි.

2.3 ලැබිය යුතු ගිණුම් :

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) මූල්‍ය ප්‍රකාශනවල පෙන්වා ඇති ණය ශේෂයන්ගෙන් එකතුව රු. 782,831 ක ණය ශේෂ 12 ක් වර්ෂ 03 සිට වර්ෂ 18 ත් අතර කාලයක් ගතවී තිබුණ ද ඒවා අයකර ගැනීමට නොහැකි වී තිබුණි.

(ආ) වෛද්‍ය පීඨයේ සේවකයින් 04 දෙනෙකු විසින් ලබාගත් ණය පියවීමකින් තොරව සේවයෙන් ඉවත්වී තිබූ අතර 2016 දෙසැම්බර් මස 31 දක්වා රු. 288,399 ක ණය ශේෂයක් ඔවුන්ගෙන් අයවීමට තිබුණි. මෙම ණය මුදල් අදාළ පුද්ගලයින්ට ලබා දී වර්ෂ 5 ත් වර්ෂ 9 ත් අතර කාලයක් ගතවී තිබුණ ද එම මුදල් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) 2016 දෙසැම්බර් මස 31 දිනට ආචාර්යවරුන් 30 දෙනෙකු විසින් ගිවිසුම් කඩකිරීම හේතුවෙන් රු. 40,086,005 ක මුදලක් අයවිය යුතුව පැවතුණි. මින් ආචාර්යවරුන් 08 දෙනෙකුගෙන් අයවිය යුතු රු. 8,121,094 ක ශේෂය වර්ෂ 11 සිට වර්ෂ 38 දක්වා කාල පරාසයක් ගතවී තිබුණ ද කිසිදු මුදලක් අයකර නොතිබූ බව නිරීක්ෂණය විය.

2.4 **නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම :**

පහත සඳහන් නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම නිරීක්ෂණය විය.

| | *නීති රීති හා රෙගුලාසිවලට යොමුව* | *අනුකූල නොවීම* |
|---|---|---|
| (අ) | 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත II කාටස 15(V) වගන්තිය | යම් උසස් අධ්‍යාපන ආයතනයක් විසින් පැවැත්විය යුතු පාඨමාලා සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අනුමැතිය ලබාගත යුතු වුවත්, එසේ අනුමැතිය ලබා ගැනීමෙන් තොරව විශ්වවිද්‍යාලයේ පීඨ 04 ක් විසින් පාඨමාලා 53 ක් පවත්වා තිබුණි. |
| (ආ) | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සහ උසස් අධ්‍යාපන ආයතන සඳහා වූ ආයතන සංග්‍රහය | |
| | (i) XX පරිච්ඡේදයේ 3.1 හා 3.2 වගන්ති | විශ්වවිද්‍යාලයේ අධ්‍යයන හා අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ සියලුම නිලධාරීන් පැමිණීමේ හා පිටවීමේ වේලාවන් සටහන් කළ යුතු වුවත් අධ්‍යයන නිලධාරීන් 743 දෙනෙකුගේ පැමිණීම හා නිවාඩු සානාථ කර නොගෙන වැටුප් හා දීමනා ලෙස රු. 1,375,562,712 ක් ගෙවා තිබුණි. |
| | (ii) XXII වැනි පරිච්ඡේදයේ 18-3 වගන්තිය | යම් තැනැත්තෙකුගේ වැඩ තහනම් කර තිබේ නම් ඔහුට විරුද්ධව පැවැත්වෙන විනය පරීක්ෂණ කටයුතු හැකිතාක් අප්‍රමාදව අවසන් කළ යුතුය. කොළඹ විශ්වවිද්‍යාලයේ කම්කරු සේවයේ නියුතුව සිටි පුද්ගලයෙක් 2005 දෙසැම්බර් 09 වැනි දින සිට අඩ වැටුප් සහිතව වැඩ තහනමකට ලක්ව ඇති අතර 2017 ජුනි මස 30 දින දක්වා වර්ෂ 11 යි මාස 06 ක් සඳහා අඩ වැටුප් ලෙස රු. 1,885,809 ක මුදලක් ගෙවා තිබුණි. කෙසේ වුවද, අදාළ විනය පරීක්ෂණ කටයුතු අවසන්ව නොතිබුණි. |

| නීති රීති හා රෙගුලාසිවලට යොමුව | | අනුකූල නොවීම |
|---|---|---|
| (ඈ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | |
| | මුදල් රෙගුලාසි අංක 371 හා 2015 ජූලි මස 14 දිනැති අංක 03/2015 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය | (i) ලබාගත් අත්තිකාකරම් මුදලින් අදාළ කාර්යය කඩිනමින් නිමකොට අත්තිකාරම් පියවිය යුතු වුවත් සමාලෝචිත වර්ෂයේ අවස්ථා 28 ක දී ලබාගෙන තිබූ එකතු වටිනාකම රු. 2,772,704 ක් වූ අත්තිකාරම් පියවීම සඳහා දින 47 සිට දින 326 ක් දක්වා කාලයක් ගතවී තිබුණි.<br>(ii) වරකට ලබාදිය හැකි උපරිම අත්තිකාරම් මුදල රු. 100,000 ක් වුවත් ආයතනය විසින් රු. 149,940 ක සිට රු. 658,103 ක් දක්වා පරාසයක් තුළ සමාලෝචිත වර්ෂයේ අවස්ථා 07 කදී අත්තිකාරම් ලබා දී තිබුණි. |
| (ඇ) | 2004 ජනවාරි 26 දිනැති අංක 2004 පුස/01 දරන ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලයේ චක්‍රලේඛය | වාර්ෂිකව පුස්තකාල පොත් සමීක්ෂණයක් පැවැත්විය යුතු වුවත් මූල්‍ය ප්‍රකාශන අනුව රු. 380,885,509 ක පුස්තකාල පොත් සහ වාර සඟරා සම්බන්ධයෙන් 2016 වර්ෂයේ වාර්ෂික පොත් සමීක්ෂණයක් පවත්වා නොතිබුණි. |
| (ඉ) | 2015 සැප්තැම්බර් 18 දිනැති අංක 13/2015 විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛය | ප්‍රවාහන පහසුකම් හිමි තනතුරකට අයත් නොවන ජ්‍යෙෂ්ඨ දරන කථිකාචාර්යවරයෙකු (ජ්‍යෙෂ්ඨ ශිෂ්‍ය උපදේශක) වෙනුවෙන් 2015 වර්ෂයේ සිට වාහනයක් සහ මාසික ඉන්ධන ලබාදී තිබුණි. සමාලෝචිත වර්ෂයේදී ලබාදුන් ඉන්ධන වටිනාකම රු. 337,720 ක් විය. |

2.5 **ප්‍රමාණවත් අධිකාර බලයකින් තහවුරු නොවූ ගනුදෙනු** :

අනුමත කාර්ය මණ්ඩලය තුළ ඇතුළත් නොවූ ජ්‍යෙෂ්ඨ නීති උපදේශක තනතුර සඳහා 2015 සැප්තැම්බර් 9 වැනි දින පැවති 499 වන පාලක සභා රැස්වීමේදී ගත් තීරණයක් ප්‍රකාරව කොන්ත්‍රාත් පදනම මත නිලධාරියෙකු බඳවාගෙන සමාලෝචිත වර්ෂය තුළ පරිපාලන අරමුදලින් රු. 1050,000 ක් ගෙවා තිබුණි.

3. **මූල්‍ය සමාලෝචනය** :

3.1 **මූල්‍ය ප්‍රතිඵල** :

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය රු. 176,157,091 ක අතිරික්තයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු. 326,038,151 ක් වීමෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය රු. 149,881,060 කින් පිරිහී තිබුණි. රජයේ ප්‍රදාන රු. 338,034,192 කින් වැඩි වී තිබුණද සේවක පාරිශ්‍රමික රු. 444,958,302 කින් හා අනෙකුත් පොදු කාර්ය වියදම් රු. 343,767,748 කින් වැඩිවීම ඉහත පිරිහීම කෙරෙහි ප්‍රධාන ලෙස බලපා තිබුණි.

සමාලෝචිත වර්ෂයේ සහ ඉකුත් වර්ෂ 4 ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී 2012 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා අතිරික්තය උච්චාවචනයන් සහිතව වර්ධනය වී තිබුණි. කෙසේ වුවද මූල්‍ය ප්‍රතිඵලයට සේවක පාරිශ්‍රමික, රජයට ගෙවූ බදු හා ජංගම නොවන වත්කම් සඳහා ක්ෂය නැවත ගැලපීමේදී විශ්වවිද්‍යාලයේ දායකත්වය 2012 වර්ෂයේ සිට අඛණ්ඩව වර්ධනය වී 2016 වර්ෂය වන විට රු. 2,968,791,856 ක් වී තිබුණි.

4. මෙහෙයුම් සමාලෝචනය

4.1 කාර්යසාධනය

විශ්වවිද්‍යාලය විසින් ලබාදුන් තොරතුරු අනුව විශ්වවිද්‍යාලයේ අරමුණු වනුයේ ඉගැන්වීම් කටයුතු සඳහා නවීනතම තාක්ෂණය භාවිතය, අධ්‍යාපන පාඨමාලාවල තත්ත්වය ජ්‍යාත්‍යන්තර මට්ටම දක්වා ඉහළ නැංවීම, ඉහළ පර්යේෂණ මට්ටමක් ඇති කිරීම සඳහා පහසුකම් පුළුල් කිරීම, විශ්වවිද්‍යාලයේ සමාජයීය වටපිටාව ඉහළ නැංවීම, අධ්‍යයන හා අනධ්‍යයන කාර්ය මණ්ඩලවල දක්ෂතාවන් ශක්තිමත් කිරීම, කළමනාකරණ පද්ධති ඉහළ නැංවීම සහ සමාජයිය යහපත තකා දැනුම හා පළපුරුද්ද යොදගැනීම වේ.

එම අරමුණු ඉටුකර ගැනීම සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2016 වර්ෂයේ සිට 2020 වර්ෂය දක්වා කාලපරිච්ඡේදයට අයත් සංයුක්ත සැලැස්මෙහි ප්‍රධාන කාර්යසාධන නිර්ණායක ලෙස දක්වා තිබූ නිර්ණායක 06 ක් කෙරෙහි විගණනයේදී අවධානය යොමු වූ අතර එම කරුණු වන කර්මාන්ත සහයෝගීතාවය සඳහා කර්මාන්ත ක්ෂේත්‍රය සහ විශ්වවිද්‍යාලය අතර අවබෝධතා ගිවිසුම් ඇතිකර ගැනීම, ප්‍රසිද්ධ සමුළු පැවැත්වීම, අධ්‍යයන කාර්ය මණ්ඩලය විසින් පොත් ප්‍රසිද්ධ කිරීම, විශ්වවිද්‍යාල අධ්‍යයන කාර්ය මණ්ඩලය හුවමාරු වැඩසටහන් යටතේ විදේශ සංචාරවල නිරතවීම, පශ්චාත් උපාධි ශිෂ්‍යයන් විසින් පර්යේෂණ පත්‍රිකා ඉදිරිපත් කිරීම සහ ජාත්‍යන්තර තරඟ සඳහා ශිෂ්‍යයින් ඉදිරිපත් කිරීම යන නිර්ණායකයන්හි ප්‍රගතිය සියයය 8 සිට සියයට 50 දක්වා අතර පරාසයක අඩු අගයක් වූ අතර එම නිර්ණායකයන් යටතේ කාර්යසාධන ප්‍රගතිය වර්ධනය කරගැනීම කෙරෙහි තවදුරටත් අවධානය යොමු විය යුතුව තිබුණි.

(ආ) ලෝක ශ්‍රේණිගත කිරීම් අතර 2015 වර්ෂයේදී 2034 ස්ථානයේ සිටි කොළඹ විශ්වවිද්‍යාලය 2016 වන විට 2171 ස්ථානය දක්වා පසුබෑමක් නිරීක්ෂණය විය.

(ඇ) 2014, 2015 හා 2016 වර්ෂවල විද්‍යා පීඨය සහ වෛද්‍ය පීඨය සඳහා බඳවාගැනීමට හැකිව තිබූ අනුමත ශිෂ්‍ය සංඛ්‍යාව 2015 දෙනෙක් වුවද බඳවාගෙන තිබුණේ ශිෂ්‍යයන් 1793 දෙනෙක් පමණක් වීම හේතුවෙන් ශිෂ්‍යයන් 222 දෙනෙකුට විශ්වවිද්‍යාලයට ඇතුළත් වීමේ අවස්ථා අහිමි වී තිබූ බව නිරීක්ෂණය විය.

(ඈ) 2014, 2015 හා 2016 වර්ෂ සඳහා කලා පීඨයට බඳවා ගැනීමට අනුමත ශිෂ්‍ය සංඛ්‍යාව 550 දෙනෙකු ලෙස දක්වා තිබුණ ද එම වර්ෂ තුනෙහිදීම පිළිවෙලින් 596 දෙනෙකු, 739 දෙනෙකු හා 692 දෙනෙකු බඳවාගෙන තිබීමෙන් වර්ෂ 03 සඳහා බඳවාගත් අතිරික්ත ශිෂ්‍ය සංඛ්‍යාව එකතුව 377 දෙනෙකු විය. විශ්වවිද්‍යාලයට බඳවාගැනීමට හැකි ශිෂ්‍ය සංඛ්‍යාව වසර ගණනාවකට පෙර තීරණය කර තිබූ අතර එම සංඛ්‍යාව කාලීනව සංශෝධනය කිරීමට කළමනාකාරීත්වය අවධානය යොමු කර නොතිබීම මේ සඳහා ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

4.2 **කළමනාකරණ ක්‍රියාකාරකම් :**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2015 දෙසැම්බර් 31 දිනට සිදුකරන ලද භෞතික පොත් පරීක්ෂාවට අනුව රු. 3,292,524 ක් වටිනා පොත් 27,367 ක් අස්ථානගත වී තිබුණි. සමාලෝචිත වර්ෂයේ දී පොත් 3,298 ක වටිනාකම වූ රු. 499,628 ක් ගිණුම්වලින් ලියාහැරීම හැර ඒ සම්බන්ධයෙන් වෙනත් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

(ආ) විශ්වවිද්‍යාලය වෙත ලබාදුන් රාජ්‍ය ප්‍රාග්ධන ප්‍රදානවලින් රු. 140,910,000 ක් සමාලෝචිත වර්ෂය අවසානයට ඉතිරි වී තිබුණු අතර ඒ තුළ ඇතුළත් රු. 107,590,000 ක් ඉකුත් වර්ෂ ගණනාවක සිට අදාළ අරමුණු සඳහා වැය කිරීමකින් තොරව ඉතිරි කර තිබුණි.

4.3 **මෙහෙයුම් ක්‍රියාකාරකම් :**

නිසි ලෙස පුරෝකථනය කළ වැය ඇස්තමේන්තුවකින් තොරව අත්තිකාරම් ලබාදීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේදී රු. 297,750 ක වියදම් සඳහා අවස්ථා 41 ක දී රු. 761,350 ක අත්තිකාරම් ලබාදී තිබුණි.

4.4 **නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම් :**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ආයතනය විසින් පවත්වාගෙන යනු ලබන විශ්වවිද්‍යාලය සතුව 2016 දෙසැම්බර් 31 දිනට පැවති අරමුදල් ගිණුම් 29 කට අදාළ එකතුව රු. 23,863,758 ක් අදාළ කාර්යයන් සඳහා උපයෝජනය කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයට අදාළ තොග සමීක්ෂණ වාර්තා අනුව ගබඩාව තුළ චලනය නොවන තොග හා සෙමින් චලනය වන තොග පිළිවෙලින් රු. 165,518 ක් හා රු. 259,760 ක් විය.

(ඇ) පුස්තකාලයෙන් පොත් වංචනික අයුරින් බැහැරගෙන යාම වැළැක්වීම සඳහා පුස්තකාල දොරටුව අසල සවිකර තිබෙන ආරක්ෂිත විද්‍යුත් ගේට්ටුව 2016 පෙබරවාරි 08 දින සිට විගණිත දිනය වූ 2017 මැයි 09 දින දක්වා වර්ෂයකට අධික කාලයක් අක්‍රීය වී තිබුණද එය අළුත්වැඩියා කර නොතිබුණි.

4.5 **ප්‍රසම්පාදන හා කොන්ත්‍රාත් ක්‍රියාවලිය** :

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) විශ්වවිද්‍යාල පරිශ්‍රය තුළ පවත්වාගෙන යනු ලබන පොත්හල, බදු දීමේදී ප්‍රසම්පාදන ක්‍රියාවලියෙන් බැහැරව බදුකරුවෙකු තෝරාගෙන තිබුණි. පොත්හල පවත්වාගෙන යන වර්ග අඩි 685 ක ගොඩනැගිල්ලෙහි තක්සේරු කුලිය නොසළකා 2008 සැප්තැම්බර් සිට 2016 දෙසැම්බර් දක්වා කාලය තුළ එකම ආයතනයක් වෙත බදු දී තිබීම නිසා රු. 966,668 ක ආදායමක් අහිමි වී තිබුණි. තවද එම පරිශ්‍රය තුළ පිහිටි බැංකුවක් සහ කිරිහල් දෙකක් වෙනුවෙන් කිසිදු බදු මුදලක් අයකර නොතිබුණි.

(ආ) 2016 මාර්තු 15 දින සිට 2018 මාර්තු 14 දින දක්වා කාලය වෙනුවෙන් විශ්වවිද්‍යාලවල ආරක්ෂක සේවාව සැපයීම සඳහා ලංසු කැඳවීම වෙනුවෙන් පිළියෙල කර තිබුණු පිරිවිතරයන්හි විශ්වවිද්‍යාලවල ආරක්ෂාව සැපයීම සම්බන්ධයෙන් වර්ෂ 03 ක පළපුරුද්ද සපුරා තිබිය යුතු බවට ඇතුළත් කර තිබුණු කොන්දේසිය හේතුවෙන් ඉදිරිපත්ව තිබුණු ලංසු අතරින් ලංසු 03 ක් ප්‍රතික්ෂේප වී තිබුණි. ඒ තුළ ඇතුළත් දෙවන අවම මිල ගණන වූ රු. 41,288,400 ක මිල ගණන් ඉදිරිපත් කර තිබුණු ලංසුව ප්‍රතික්ෂේප වී තිබීම හේතුවෙන් පස්වන අවම මිල ගණන වූ රු. 44,454,896 කට ලංසුව ඉදිරිපත් කර තිබුණු ආයතනයට ප්‍රසම්පාදනය පිරිනැමීමට සිදු වී තිබුණි. ඒ අනුව එක් වර්ෂයක් සඳහා රු. 3,666,496 ක් බැගින් 2016 මාර්තු සිට 2018 මාර්තු මාසය දක්වා රු. 7,332,992 ක මුදලක් වැඩිපුර ගෙවීමට සිදුවී තිබුණි.

(ඇ) විශ්වවිද්‍යාලයේ මහල් 05 කින් යුත් සුජාතා ජයවර්ධන කාන්තා නේවාසිකාගාරයේ වැසිකිලි 50 ක් හා නාන කාමර 30 ක් නවීකරණය කිරීම සඳහා රු. 25,359,367 ක (වැට් සහිත) මුදලකට පුද්ගලික සමාගමක් සමග 2013 දෙසැම්බර් 24 දින ගිවිසුමට එළඹ තිබුණි. වැඩ ප්‍රමාද කිරීමේ හේතුවෙන් 2015 ජුනි 16 දින විශ්වවිද්‍යාලය විසින් අදාල කොන්ත්‍රාත්තු ගිවිසුම අවලංගු කළ බව කොන්ත්‍රාත්කරු වෙත දන්වා තිබුණි. එසේ වුවද ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.4.8 වගන්තිය පරිදි ලබාගෙන ඇති රු. 1,132,114 ක් වටිනා කාර්යසාධන ඇපකරය, කල් ඉකුත්වීමට පෙර විශ්වවිද්‍යාලය වෙත අයකරගත යුතුව තිබුණද එය අයකරගැනීමට කටයුතු කර නොතිබුණි.

ඉහත කොන්ත්‍රාත් ගිවිසුම අවලංගු කිරීමෙන් අනතුරුව රු. 11,197,072 ක්වූ ඉතිරි වැඩ නිමකරගැනීම සඳහා ප්‍රසම්පාදන ක්‍රියාවලිය අනුගමනය කර කොන්ත්‍රාත්කරුවකු තෝරාගැනීම වෙනුවට, 2015 වර්ෂයේ ආයතනයේ ලියාපදිංචි කොන්ත්‍රාත්කරුවන් 5 දෙනෙකු වෙත මහල් 5 හි ඉතිරි ඉදිකිරීම් වැඩ වෙන වෙනම පවරා තිබුණි.

(ඈ) සුජාතා ජයවර්ධන නේවාසිකාගාරයේ පැරණි ගොඩනැගිල්ල, හැව්ලොක් නේවාසිකාගාරයේ පැරණි ගොඩනැගිලි, බ්ලොට් ෆෝමේන් නේවාසිකාගාරයේ ඉදිරිපස ගොඩනැගිල්ලේ පහළ මාලය සහ පිටුපස මැද ගොඩනැගිලි අළුත්වැඩියා කිරීම කෙරෙහි කළමනාකරණයේ අවධානය නිසිපරිදි යොමුවී නොතිබූ බැවින් මෙම නේවාසිකාගාර භාවිතයට නුසුදුසු තත්ත්වයේ පැවතියද එහි සිසුන් නේවාසිකව සිටින බව නිරීක්ෂණය විය.

4.6 **කාර්ය මණ්ඩල පරිපාලනය** :

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අනුමත කාර්ය මණ්ඩලයේ පුරප්පාඩු 325 ක් පැවතුණි. ආචාර්යවරුන්ගේ පුරප්පාඩු 111 ක් පැවතීම හේතුවෙන් බාහිර කථිකාචාර්යවරුන් බඳවාගෙන තිබූ අතර සමාලෝචිත වර්ෂයේදී බාහිර කථිකාචාර්යවරු 379 දෙනෙකුගේ සේවය ලබාගැනීම වෙනුවෙන් රු. 29,406,870 ක මුදලක් ගෙවා තිබුණි.

(ආ) කාලීනව වැදගත් නොවන යතුරු ලේඛක තනතුරු 05 ක් සහ ලඝු ලේඛක තනතුරු 17 ක් පුරප්පාඩුව පැවති අතර එම තනතුරු වෙනුවට කාලීනව වැදගත් වන තනතුරු ඇතිකර ගැනීම කෙරෙහි අවධානය යොමු කර නොතිබුණි.

5. **ගිණුම් කටයුතුභාවය හා යහපාලනය** :

5.2 **අයවැය ලේඛනමය පාලනය** :

සමාලෝචිත වර්ෂයේ අයවැය ලේඛනයේ වැය විෂයයන් 20 ක අයවැයගත වියදම් හා තථ්‍ය වියදම් අතර සියයට 10 සිට සියයට 100 දක්වා විචලනයන් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදා ගෙන නොතිබූ බව නිරීක්ෂණය විය.

6. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින් වර විශ්වවිද්‍යාලයේ උපකුලපතිගේ අවධානයට යොමුකරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමුකළ යුතුය :

| | *පද්ධති හා පාලන ක්ෂේත්‍ර* | *නිරීක්ෂණ* |
|---|---|---|
| (අ) | ස්ථාවර වත්කම් කළමනාකරණය | දේපළ අයිතිය තහවුරු කර නොගැනීම, වත්කම් නඩත්තු කිරීම හා අපහරණ පිළිබඳ දුර්වලතා පැවතීම. |
| (ආ) | ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම් | ශේෂ නිරවුල් කිරීමට අවශ්‍ය පියවර නොගැනීම. |
| (ඇ) | අරමුදල් පවත්වාගෙන යාම | අරමුදල් පිහිටවූ නිශ්චිත කාර්යයන් සඳහා නොයෙදවීම. |
| (ඈ) | කොන්ත්‍රාත් පරිපාලනය | අදාල ලිපිගොනු විධිමත්ව නඩත්තු නොකිරීම සහ අධීක්ෂණය දුර්වල මට්ටමක පැවතීම. |
| (ඉ) | කාර්ය මණ්ඩල පරිපාලනය | අධ්‍යයන කාර්ය මණ්ඩලය පැමිණීම සටහන් නොකිරීම. |
| (ඊ) | පුස්තකාල පරිපාලනය | විධිමත් පරිදි පුස්තකාල පොත් සමීක්ෂණ නොපැවැත්වීම, සංසන්දනාත්මක ලේඛන විධිමත්ව පවත්වාගෙන නොයාම. |
| (උ) | මෙහෙයුම් පාලනය | ශිෂ්‍යයන්ට අධ්‍යයන කටයුතු කරගෙන යාමට සුදුසු පරිසරයක් පවතින ආකාරයට නේවාසිකාගාර පවත්වාගෙන නොයාම. |

එච්.එම්. ගාමිණී විජේසිංහ,
විගණකාධිපති.

02 - 416

---

## ශ්‍රී ලංකා නැගෙනහිර විශ්වවිද්‍යාලයේ සෞන්දර්ය අධ්‍යාපනය පිළිබඳ ස්වාමිවිපුලානන්ද ආයතනය

2016 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

| | *2016.12.31* | *2015.12.31* |
|---|---|---|
| | *රු. ශත* | *රු. ශත* |
| **වත්කම්** | | |
| *ජංගම නොවන වත්කම්* | | |
| දේපල පිරියත හා උපකරණ | 347,433,707 | 359,721,525 |
| අස්පෘශ්‍ය වත්කම් | 1,291,544 | - |
| ප්‍රාග්ධන නොනිමි වැඩ | 11,111,047 | - |
| මුළු ජංගම නොවන වත්කම් | 359,836,299 | 359,721,525 |
| *ජංගම වත්කම්* | | |
| තොගය | 1,308,962 | 1,402,827 |
| තැන්පත් හා අත්තිකාරම් | 12,131,278 | 8,335,431 |
| මුදල් හා මුදල් සමාන දෑ | 98,888,524 | 61,510,157 |
| මුළු ජංගම වත්කම් | 112,328,763 | 71,248,415 |
| **මුළු වත්කම්** | 472,165,062 | 430,969,941 |

| | 2016.12.31<br>රු. ශත | 2015.12.31<br>රු. ශත |
|---|---|---|
| **හිමිකම් හා වගකීම්** | | |
| හිමිකම් | | |
| සමුච්චිත ප්‍රාග්ධන ප්‍රතිපාදන | 263,050,113 | 209,550,113 |
| අනෙකුත් ප්‍රතිපාදන | 2,500,000 | 2,500,000 |
| ත්‍යාග හා ප්‍රදාන | 231,570,152 | 231,450,152 |
| පොදු සංචිත | (52,070,952) | (30,803,268) |
| මුළු හිමිකම් | 445,049,313 | 412,696,996 |
| **වගකීම්** | | |
| **ජංගම නොවන වගකීම්** | | |
| පාරිතෝෂික සඳහා වෙන්කිරීම් | 5,693,528 | 5,031,838 |
| මුළු ජංගම නොවන වගකීම් | 5,693,528 | 5,031,838 |
| **ජංගම වගකීම්** | | |
| ගෙවිය යුතු ගිණුම් | 3,775,910 | 7,688,029 |
| ආපසු ගෙවිය යුතු දෑ | 2,937,228 | 3,589,603 |
| ගෙවිය යුතු සිසුන් සඳහා මූල්‍යාධාර | 2,866,890 | 890 |
| උපචිත වියදම් | 11,842,194 | 1,962,585 |
| මුළු ජංගම වගකීම් | 21,422,222 | 13,241,107 |
| මුළු වගකීම් | 27,115,749 | 18,272,944 |
| **මුළු හිමිකම් හා වගකීම්** | 472,165,062 | 430,969,941 |

ශ්‍රී ලංකා වරගත් ගණකාධිකාරී ආයතන විසින් නිකුත් කර ඇති ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව, 1978 අංක 16 දරන විශ්ව විද්‍යාල පනතේ 106(i) හා 107(ii) b කොටස් අනුව හා 1971 අංක 38 දරන මූල්‍ය පනතේ 13(6) කොටස්වලට අනුකූලව, මෙම මූල්‍ය ප්‍රකාශ පිළියෙල කර ඉදිරිපත් කරනු ලැබ ඇත.

දෙස්තර ජේශංකර්,
ගණන් දීමේ නිලධාරී,
අධ්‍යක්ෂක.

ටී. විජයකුමාර්,
සහකාර ගණන් දීමේ නිලධාරී,
සහකාර ලේඛකාධිකාරී.

එම්. කේ. ඩී. ලක්මාලි,
ජ්‍යෙෂ්ඨ සහකාර මූල්‍යාධිකාරී.

ශ්‍රී ලංකා නැගෙනහිර විශ්වවිද්‍යාලයේ සෞන්දර්ය අධ්‍යාපනය පිළිබඳ ස්වාමිවිපුලානන්ද ආයතනය,
2016 දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
මූල්‍ය ක්‍රියාකාරිත්වය පිළිබඳ ප්‍රකාශය.

| | 2016.12.31<br>රු. ශත | 2015.12.31<br>රු. ශත |
|---|---|---|
| පුනරාවර්තන ප්‍රතිපාදන | 146,175,000 | 136,900,000 |
| වෙනත් ආදායම් | 3,485,112 | 1,527,833 |
| මුළු මෙහෙයුම් ආදායම | 149,660,112 | 138,427,833 |
| මෙහෙයුම් වියදම් | | |
| වැටුප් හා වේතන | 93,871,504 | 88,530,822 |
| ගමන් වියදම් | 818,516 | 146,776 |
| සැපයුම් හා පාරිභෝගික භාවිත | 3,647,754 | 3,657,009 |
| සුළු නඩත්තු වියදම් | 2,453,719 | 2,070,516 |

| | *2016.2.31* *රු. ශත* | *2015.12.31* *රු. ශත* |
|---|---|---|
| කොන්ත්‍රාත්තු සේවා | 30,165,217 | 24,412,581 |
| ක්ෂය හා ක්‍රමක්ෂය වියදම් | 27,754,550 | 13,910,035 |
| වෙනත් මෙහෙයුම් වියදම් | 12,216,536 | 8,615,336 |
| මුළු මෙහෙයුම් වියදම් | 170,927,796 | 141,343,075 |
| මෙහෙයුම් කටයුතුවලින් ලද අතිරික්තය/(ඌනතාව) | (21,267,684) | (2,915,242) |
| මුළු කටයුතුවලින් ලද අතිරික්තය/(ඌනතාව) | (21,267,684) | (2,915,242) |
| කාලච්ඡේදය සඳහා වූ උද්ධ අතිරික්තය/(ඌනතාව) පොදු සංචිතයට මාරු කරන ලද | (21,267,684) | (2,915,242) |

## ශ්‍රී ලංකා නැගෙනහිර විශ්වවිද්‍යාලයේ සෞන්දර්ය අධ්‍යාපනය පිළිබඳ ස්වාමිවිපුලානන්ද ආයතනය

2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශය

| | *2016* *රු. ශත* | *2015* *රු. ශත* |
|---|---|---|
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ලද මුදල් ප්‍රවාහ** | | |
| සාමාන්‍ය ක්‍රියාකාරකම්වලින් ලද අතිරික්තය/ඌනතාව | (21,267,684) | (1,269,826) |
| **මුදල් නොවන ප්‍රවාහ** | | |
| ක්ෂය හා ක්‍රමක්ෂය වියදම් | 27,754,550 | 13,910,035 |
| පාරිතෝෂික සඳහා වෙන්කිරීම් | 2,043,918 | 5,031,838 |
| | 8,530,783 | 17,672,046 |
| තොගය (වැඩි) අඩු වීම | 93,865 | (300,246) |
| තැන්පත් හා අත්තිකාරම් වැඩි අඩුවීම | (3,795,847) | 5,124,410 |
| ගෙවිය යුතු ගිණුම් වැඩි (අඩු) වීම | (3,912,119) | (248,352) |
| පෙරකාලීන අයිතම වැඩි (අඩු) වීම | (652,376) | 3,589,603 |
| ගෙවිය යුතු සිසුන් සඳහා මූල්‍යාධාර වැඩි (අඩු) වීම | 2,866,000 | (2,238,050) |
| උපචිත වියදම් වැඩි (අඩු) වීම | 9,879,610 | 1,962,585 |
| | 4,479,134 | 7,889,951 |
| | 13,009,917 | 25,561,997 |
| පාරිතෝෂික | (1,382,228) | - |
| මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ලද ශුද්ධ මුදල් ප්‍රවාහය | 11,627,689 | 25,561,997 |
| ආයෝජන ක්‍රියාකාරකම්වලින් ලද මුදල් ප්‍රවාහය | | |
| දේපල පිරියත උපකරණ ගැණුම් | (14,916,217) | (66,190,827) |
| නොනිම් වැඩ | (11,111,047) | - |
| අස්පෘශ වත්කම් | (1,722,059) | - |
| ආයෝජන ක්‍රියාකාරකම්වලින් ලද ශුද්ධ මුදල් ප්‍රවාහය | (27,749,323) | (66,190,827) |
| ප්‍රාග්ධන ප්‍රතිපාදන | 53,500,000 | 5,000,000 |
| මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ලද ශුද්ධ මුදල් ප්‍රවාහය | 53,500,000 | 5,000,000 |
| මුදල් හා මුදල් සමාන දෑ වල ශුද්ධ වැඩි (අඩු) වීම | 37,378,366 | (35,628,829) |
| කාලපරිච්ඡේදය මුල මුදල් හා මුදල් සමාන දෑ | 61,510,157 | 52,138,987 |
| කාලපරිච්ඡේදය අවසානයේ මුදල් හා මුදල් සමාන දෑ | 98,888,524 | 16,510,157 |

### ශ්‍රී ලංකා නැගෙනහිර විශ්වවිද්‍යාලයේ සෞන්දර්ය අධ්‍යාපනය පිළිබඳ ස්වාමිවිපුලානන්ද ආයතනය

2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශය

| | සමුච්චිත අරමුදල<br>රු. | පොදු සංචිත<br>රු. | එකතුව<br>රු. |
|---|---|---|---|
| 2014 දෙසැම්බර් 31 දිනට ශේෂය | 151,708,800 | (29,533,442) | 122,175,357 |
| අතිරික්තය/(ඌනතාවය) | | 4,015,938 | 4,015,938 |
| වෙනත් ගැලපුම් | | (6,931,180) | (6,931,180) |
| අතිතයානු යෝගී ගැලපුම් | | 1,645,416 | 1,645,416 |
| අතිරේක දායකත්වය | 50,000,000 | - | 50,000,000 |
| 2015 දෙසැම්බර් 31 දිනට ශේෂය | 201,708,800 | (30,803,268) | 170,905,532 |
| අතිරික්තය/(ඌනතාවය) | | (21,267,684) | (21,267,684) |
| අතිරේක දායකත්වය | 53,500,000 | - | 53,500,000 |
| 2016 දෙසැම්බර් 31 දිනට ශේෂය | 255,208,800 | (52,070,952) | 203,137,848 |

02 - 221

---

# විවිධ දෙපාර්තමේන්තු දැන්වීම්

### ප්‍රාදේශීය සංවර්ධන බැංකුව

2008 අංක 41 දරන ප්‍රාදේශීය සංවර්ධන බැංකු පනතේ 40 වැනි වගන්තිය මගින් බලාත්මක කරන ලද 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ විශේෂ විධිවිධාන පනතේ 04 වැනි වගන්තිය යටතේ ප්‍රාදේශීය සංවර්ධන බැංකුවෙහි අධ්‍යක්‍ෂ මණ්ඩලය විසින් සම්මත කරගන්නා ලද යෝජනා සම්මුතිය

දිසානායක මුදියන්සේලාගේ බුද්ධික දිසානායක/ කලුආරච්චිගේ තිලක් චන්දන කුමාර
ඉතිරි කිරීම් ගිණුම් අංක : 731010102519
ණය ගිණුම් අංක :731059600109

ප්‍රාදේශීය සංවර්ධන බැංකුවෙහි අධ්‍යක්‍ෂ මණ්ඩලය විසින් 2017 නොවැම්බර් මස 28 වැනි දින පැවැත්වීමට යෙදුණු 2017/13 දරන අධ්‍යක්‍ෂ මණ්ඩල රැස්වීමේදී පහත සඳහන් අයුරින් විශේෂිතව හා ඒකමතිකව යෝජනා සම්මත කරන ලදී.

ප්‍රාදේශීය සංවර්ධන බැංකුව වෙනුවෙන් ගල්ගමුව නීතිඥ හා ප්‍රසිද්ධ නොතාරිස් සන්ධ්‍යා එල් එදිරිමුණි මහත්මිය විසින් සහතික කරන ලද 2016.11.22 වැනි දින හා අංක 7214 දරන උකස් ඔප්පුව ප්‍රකාරව අයවිය යුතු මුදල් ගෙවීම ණයකරු ලෙස හඳුන්වනු ලබන, හිරණ්‍යා පොත්හල, අනුරාධපුර පාර, අඹන්පොල යන ලිපිනයේ පදිංචි දිසානායක මුදියන්සේලාගේ බුද්ධික දිසානායක හා අංක 13, අනුරාධපුර පාර, අඹන්පොල යන ලිපිනයේ පදිංචි කලුආරච්චිගේ තිලක් චන්දන කුමාර යන අය ණය ගෙවීම පැහැරහැර ඇති බැවින් එකී උකස්කරය යටතේ 2017.08.29 වැනි දිනට ප්‍රාදේශීය සංවර්ධන බැංකුවට අයවිය යුතු රුපියල් හතලිස් හය ලක්‍ෂ තිස් අට දහස් හයසිය තිහයි ශත තිස් හතක (රු. 4,638,630.37) ණය මුදල, එදිනට අයවිය යුතු පොලිය රුපියල් අනූ හය දහස් නමසිය දොළහයි ශත දහහතරක (රු. 96,912.14) මුදල හා එදිනට අයවිය යුතු ගාස්තු රුපියල් විසිතුන් දහසක (රු. 23,000) මුදල හා 2017.08.29 දින සිට වෙන්දේසි දින දක්වා වාර්ෂික 18% පොලී අනුපාතිකය යටතේ අයවිය යුතු පොලියද වැට් බදු හා දැන්වීම් ගාස්තුද ඇතුළු වෙන්දේසි වියදම්ද සමග තවදුරටත් නීත්‍යානුකූල වියදමක් බැංකුවට අයවීමට තිබේ නම් එම මුදල්ද අයකර ගැනීම සඳහා ණයකරුවන් විසින් අංක 7214 දරන උකස්කරය මගින් ප්‍රාදේශීය සංවර්ධන බැංකුවට උකස් කර ඇති මෙහි පහත උපලේඛනයෙහි විස්තර කරන දේපල ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු ය. එම දේපලෙහි විස්තර පහත උපලේඛනයෙහි දැක්වේ.

තවද එකී උපලේඛනය මගින් විස්තර කර ඇති දේපල වෙන්දේසි කිරීමේ බලය අංක 24, ටොරින්ටන් පාර, මහනුවර පිහිටි ෂොක්මන් සහ සමරවික්‍රම සමාගම වෙත පවරා ඇත.

#### උකස්කර ඇති දේපල පිළිබඳ විස්තරය

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, වන්නිහත්පත්තුවේ, ගන්තිහේ කෝරලේ, මහව ප්‍රාදේශීය සභා බලසීමාව තුල පිහිටි අඹන්පොල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 191 උඩංගාව ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, කිවුලේගම නැමැති ගමේ පිහිටි අ.ග.පි. 3178 හි කැබලි අංක 02 දරන ප්‍රමාණයෙන් හෙක්ටයාර් බිංදුවයි

දශම දෙකයි බිංදුවයි බිංදුවයි බිංදුවක් (හෙක් 0.2000) විශාල රජයේ ඉඩමෙන් මැන වෙන්කර ඇති වර්ෂ 2016.04.28 දිනැති කුරුණෑගල මිනින්දෝරු අධිකාරි විසින් නිකුත් කර ඇති අ.ග.පි. 3178 හි අතිරේක අංක 06 පත්‍ර අංක 06 හි කැබලි අංක 105 දරන ප්‍රමාණයෙන් හෙක්ටයාර් බිංදුවයි දශම එකයි බිංදුවයි බිංදුවයි බිංදුවක් (හෙක් 0.1000) විශාල බිම් කොටසට එකී පිඹුර පිරිදි මායිම්, උතුරට : අ.ග.පි. 3178 හි අතිරේක අංක 06 පත්‍ර අංක 06 කැබලි අංක 104 ද, නැගෙනහිරට : කුරුණෑගල - අනුරාධපුර ප්‍රධාන පාර ද, දකුණට : අ.ග.පි. 3178 හි කැබලි අංක 107 ද, බස්නාහිරට : මෙම පිඹුරේ කැබලි අංක 106 ද, යන මායිම් තුළ පිහිටි ඉඩම හා ඊට අයිති ගහකොළ, පලතුරු, ගොඩනැගිලි ආදී සෑම සියළු දේද වේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්

ප්‍රාදේශීය සංවර්ධන බැංකුව,
ප්‍රධාන කාර්යාලය,
අංක 933, නුවර පාර,
වෙදමුල්ල,
කැළණිය.

02 - 344

---

## ජාතික සංවර්ධන බැංකුව

### 1990 අංක 4 දරන බැංකු ණය අයකර ගැනීමේ (විශේෂ විධි විධාන) පනතේ 04 වැනි වගන්තිය යටතේ 2017 දෙසැම්බර් මස 19 වැනි දින ජාතික සංවර්ධන බැංකුවේ පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී සම්මත කර ගන්නා ලද යෝජනාවලට අදළ උධෘතයකි

2017 දෙසැම්බර් මස 19 වැනි දින ජාතික සංවර්ධන බැංකුවේ පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී පහත දැක්වෙන යෝජනාව ඒකමතිකව සහ විශේෂයෙන් සම්මත කර ගන්නට යෙදුනි.

උණවටුන පදිංචි ගඟබඩ කන්කානම්ගේ ශාන්ත කුමාර ගුණරත්න යන අය විසින් උණ වටුනේ "සමායා බිච් හොටෙල්" යන නාමය හා විලාසය යටතේ පවත්වාගෙන යනු ලබන ව්‍යාපාරයේ තනි අයිතිකරු (ණයකරු) ගාල්ල ප්‍රසිද්ධ නොතාරිස් බිමාලි සූරිය ආරච්චි මහත්මිය විසින් ලියා සහතික කරන ලද අංක 1383 දරන 2015.11.23 දින ලියා සහතික කරන ලද උකස්කරය හා අංක 1476 දරන 2016.06.16 වැනි දින ඇය විසින්ම සහතික කරන ලද බැඳුම්කරය ද මත ජාතික සංවර්ධන බැංකුව වෙතින් ලබා ගත් ණය/පහසුකම ආපසු නොගෙවා හිඟ තබා ඇත.

2017 නොවැම්බර් මස 30 වැනි දින වන විට එකී බැඳුම්කර මත බැංකුව වෙත අය විය යුතුව ඇති මුදල රුපියල් මිලියන දහයකුත් හය ලක්ෂ හැට එක් දහස් අටසිය හතලිස් හතරයි ශත තිස් තුනක් (රු. 10,661,844.33) කි.

1990 අංක 4 දරන ණය අයකර ගැනීමේ (විශේෂ විධි විධාන) (ප්‍රධාන පනත) යටතේ පැවරී ඇති බලතල ප්‍රකාරව ක්‍රියා කරමින් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය ණයකරු බැංකුවෙන් ලබා ගන්නා ලද ණය/ණය පහසුකම වෙනුවෙන් බැංකුව වෙත උකස් කරන ලද එකී දේපළට අදළ සින්නක්කර සහ වෙනත් සියලුම අයිතිවාසිකම් පී.කේ.ඊ. සේනාපති බලයලත් වෙන්දේසිකරු ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණා රුපියල් මිලියන දහයකුත් හය ලක්ෂ හැට එක් දහස් අටසිය හතලිස් හතරයි ශත තිස් තුනක (රු. 10,661,844.33) මුදල හෝ ඉන් කොටසක් හෝ විකිණීම සිදු කරනු ලබන අවස්ථාව වන විටත් නොගෙවා ඇති හිඟ මුදල සඳහා අංක 1476 දරන එකී ඇපකරය මත සියයට දහතුනකුත් දශම එකක් (13.01%) වන වාර්ෂික පොලිය ද සහ එකී මුල් මුදල වන රුපියල් මිලියන පහකුත් හත් ලක්ෂ හතලිස් එක් දහස් හය සිය හැට නවයයක් (රු. 5,741,669.00) සහ මත අංක 1383 දරන එකී ඇපකරය මත සියයට දහහතරකුත් දශම දෙකයි පහක (14.25%) වන වාර්ෂික පොලිය ද සහ එකී මුල් මුදල වන රුපියල් මිලියන තුනකුත් අට ලක්ෂ තිස්තුන් දහස් තුන්සිය තිස් අටක් (රු. 3,833,338.00) සහ ප්‍රධාන පනතේ 4 වැනි වගන්තිය ප්‍රකාර ප්‍රසිද්ධ කිරීමේ විකුණුම් ගාස්තු සහ අනෙකුත් වියදම් ද සහ හිඟ වන ගෙවීම් (ඇත්නම්) අයකර ගැනීමටත් යෝජනා සම්මතකර ගන්නා ලදී.

### ඉහත කී උපලේඛනය

දකුණු පළාතේ, ගාල්ල දිස්ත්‍රික්කයේ, තල්පේ පත්තුවේ, හබරාදුව ප්‍රාදේශීය සභා සීමාව තුළ හබරාදුව ප්‍රාදේශීය ලේකම් කාර්යාල කොට්ඨාසයේ අංක 137 වී දරන යද්දෙහිමුල්ල ග්‍රාම නිළධාරී කොට්ඨාසයේ උණවටුන යද්දෙහිමුල්ල ගමේ පිහිටා ඇති "කුඩාමාලගේවත්ත" නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු එස්. ඩබ්ලිව්. පීරිස් මහතා විසින් 2012.09.08 වැනි දින අංක 01 දරන කැබැල්ලෙන් නැවත බෙද වෙන් කරන ලදුව මැන සාදන ලද අංක 4938 දරන පිඹුරේ දැක්වෙන කැබලි අංක 1ඒ දරන පර්චස් දහ හතරකුත් දශම හයක් (අ. 0, රූ. 0, පර්. 14.6) වපසරියෙන් ඉඩම් කැබැල්ලට මායිම් උතුරට : මාලගේ වත්ත, නැගෙනහිරට : උස්මද්දුමගේ වත්ත, දකුණට: වැල්ලේ දේවාල පාර, බස්නාහිරට : මෙම ඉඩමේ කැබලි අංක 01 බී ද වන අතර එහි පිහිටි පස, ගස, කොළ, ස්ථිර ගොඩනැගිලි සහ වෙනත් සියලු දේද සමග වේ.

ඉහත කී කැබලි අංක 1 ඒ දරන ඉඩම පහත දැක්වෙන ඉඩමෙන් නැවත බෙද වෙන් කරන ලද්දකි.

දකුණු පළාතේ, ගාල්ල දිස්ත්‍රික්කයේ, තල්පේ පත්තුවේ, හබරාදුව ප්‍රාදේශීය සභා සීමාව තුළ හබරාදුව ප්‍රාදේශීය ලේකම් කාර්යාල කොට්ඨාසයේ අංක 137 වී දරන යද්දෙහිමුල්ල ග්‍රාම නිළධාරී කොට්ඨාසයේ උණවටුන යද්දෙහිමුල්ල ගමේ පිහිටා ඇති "කුඩාමාලගේවත්ත" නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු

එච්. විසුම්පෙරුම මහතා විසින් 1977.07.03 දින මැන සාදන ලද අංක 1005 දරන පිඹුරේ දැක්වෙන අංක 1 දරන කැබැල්ල 1985.01.06 වැනි දින එකී මිනින්දෝරු තැන විසින්ම අනු බෙදුමක් මගින් බෙදා වෙන් කරන ලදුව එකී කැබලි අංක 1ඒ දරන පර්චස් පහළොවක් (අ. 0, රූ. 0, පර්. 15) විශාලත්වයට මායිම් උතුරට : මාලගේ වත්ත, නැගෙනහිරට : උස්මද්දුමගේ වත්ත, දකුණට: යද්දෙහි මුල්ල සිට මාතර දක්වා දිවෙන මාර්ගය, බස්නාහිරට : මෙම ඉඩමේ කැබලි අංක 01 බී වන අතර එහි පිහිටි පස, ගහ කොළ, ස්ථිර ගොඩනැගිලි සහ වෙනත් සියලු දේද සමග වේ. මෙය ගාල්ල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ එස් 34/55 වෙලුම්/පත්‍රිරුවේ ලියාපදිංචි කර ඇත.

මෙහි ඉහතින් වඩාත් සවිස්තරව විස්තර කර ඇත්තාවූ මෙම දේපළ තුළ ස්ථිරව සවිකර ඇති යන්ත්‍ර උපකරණ සවිකිරීම් සහ සේවාවන්ද හෝ ඉදිරියේදී වරින් වර ස්ථාපිත කරනු ලබන්නා වූ හෝ සියලු දේත් ජලය, විදුලිය, දුරකථන, විදුලි සංදේශ උපකරණ හා වායු සමීකරණ පද්ධති ආදී සෑම සියලුදෙයක්ම ද මීට ඇතුළත් වේ.

ලේකම්,
ජාතික සංවර්ධන බැංකුව.

2018 ජනවාරි මස 9 වැනි දින.

02 - 415